# ද මැසිනොද් විදුහල - කඳාන

**දෙවනවාර පරීක්ෂණය - 2019** 24-07-2019

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I**

**11 ශ්‍රේණිය** කාලය - පැ. 01

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බේකරි පාඨමාලාවක් හදාරා ඇති ගෘහනියක් වන රසිකා පාන් හා පේස්ට්‍රි, තම නිවසේම නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර ඇත. නිවස අසල උපකාරක පන්තියක් ආරම්භ කර තිබීම නිසා ඇයගේ දෛනික අලෙවිය වැඩි කර ගැනීමට හේතුවී ඇත.

1. ඉහත සිද්ධියට අදාලව අවශ්‍යතාවයක් හා වුවමනාවක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
   i. පාන් - ආහාර ii. ආහාර - පේස්ට්‍රි iii. ආහාර - සෞඛ්‍ය iv. පාන් - පේස්ට්‍රි

2. නිෂ්පාදනය කරනු ලබන නිෂපාදිත වල ස්වභාවය අනුව රසිකාගේ ව්‍යාපාරය,
   i. සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
   ii. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
   iii. සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයකි
   iv. තොග වෙළෙඳ ව්‍යාපාරයකි.

3. ඉහත සිද්ධියේ සඳහන් ශක්තියක් වනුයේ,
   i. රසිකා ගෘහනියක් වීම.
   ii. නිවස අසල උපකාරක පන්තියක් ආරම්භ කර තිබීම.
   iii. රසිකා බේකරි පාඨමාලාවක් හදාරා තිබීම.
   iv. රසිකාගේ දෛනික අලෙවිය වැඩිවීම.

4. රසිකා විසින් ආරම්භ කර ඇති ව්‍යාපාරය
   i. පොදු අංශයේ ව්‍යාපාරයකි.
   ii. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.
   iii. මහා පරිමාණ ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
   iv. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.

5. රසිකා විසින් ආරම්භ කර ඇති ව්‍යාපාරයේ වාසියක් නොවන්නේ,
   i. පහසුවෙන් ආරම්භ කළහැකි වීම.
   ii. වගකීම් සීමිත වීම
   iii. සියලුම ලාභ අයිතිකරු සතු වීම.
   iv. තීරණ ගැනීමේ ස්වාධින බව.

6. ව්‍යාපාරයකට .......(1)...... තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියත්මක කිරීම සිදු කරන අතර .....(2)...... රැකියා සුරක්ෂිත බව පිළිබඳ උනන්දුවක් දක්වති.
   ඉහත ප්‍රකාශයේ (1) හා (2) යන ස්ථාන වලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   i. කළමනාකරුවෝ , සේවකයෝ
   ii. අයිතිකරුවෝ , සේවකයෝ
   iii. සේවකයෝ , සැපයුම්කරුවෝ
   iv. සේවකයෝ , අයිතිකරුවෝ

Learning Resource Centre R De Mazenod College Kandana

7. ව්‍යාපාර පරිසරයේ සිදුවූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

A - නව යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම.

B - ආදායම් ව්‍යාප්තියේ විෂමතා වැඩිවීම.

C - බැංකු පොලී අනුපාතය පහළ දැමීම.

ඉහත සිදුවීම් අතරින් දේශපාලන පරිසර සාධක පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

i. A හා B ii. B හා C iii. A,B හා C යන සියල්ලම iv. A පමණි.

8. බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසියක් නොවන්නේ,

i. චෙක්පත් මගින් ගෙවීම් කළහැකි වීම.

ii. දවසේ ඕනෑම වෙලාවක ගනුදෙනු කළහැකි වීම.

iii. බැංකු අයිරා පහසුකම් ලබාගත හැකි වීම.

iv. සෘජු ප්‍රේෂණ රැස් කිරීම.

9. චෙක්පත් රේඛනය සම්බන්ධයෙන් කර ඇති පහත ප්‍රකාශ අතරින් නිවරදි නොවන්නේ,

i. චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම චෙක්පතක් රේඛනය කිරීම ලෙස හැඳින්වේ.

ii. චෙක්පතකට වැඩි ආරක්ෂාවක් ලබා ගැනීම සඳහා රේඛනය කරයි.

iii. රේඛනය මගින් තහවුරු කරන්නේ තමාට අදාල චෙක්පත පිළිබඳ අව්‍යාජ හිමිකමක් පැවති බවයි.

iv. චෙක්පතක් රේඛනය කිරීම ප්‍රධාන ආකාර දෙකකට සිදු කළ හැකිය.

10. රු. 800 000 ක වටිනාකමකට රක්ෂණය කර ඇති මෝටර් රථයක් අනතුරකට භාජනය වී රු. 150 000 ක හානියක් සිදුවී ඇතිනම් ලබාගත හැකි රක්ෂණ වන්දියේ වටිනාකම හා රීට අදාල මූලධර්මය නිවැරදිව පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

i. රු. 800 000 , හානිපූරණය

ii. රු. 800 000 , උපරිම විශ්වාසය

iii. රු. 150 000 , රක්ෂණ හිමිකම

iv. රු. 150 000 , හානිපූරණය

11. සන්නිවේදන ක්‍රියාවලියේ පහත නිර්වචනය කර ඇති මූලිකාංග අතරින් නිවරදිව නිර්වචනය කර නොමැති මූලිකාංගය වනුයේ,

i. යවන්නා - පණිවිඩය ලබා දෙන පුද්ගලයා

ii. ප්‍රතිචාරය - ලැබුණු පණිවුඩය ලැබුණු බවට හා තේරුම්ගත් බවට ලබන්නාගෙන් යවන්නා වෙත වාචිකව හෝ වාචික නොවන මාර්ගයකින් ලැබෙන ප්‍රතිචාරය

iii. මාධ්‍යය - පණිවුඩය යැවීම සඳහා යොදා ගන්නා සන්නිවේදන මාධ්‍යය.

iv. පණිවුඩය - යවන්නා විසින් සපයන තොරතුරු

12. මාර්ගය , මාධ්‍යය, බලය, පර්යන්තය යනු ප්‍රවාහන මූලිකාංග සඳහා උදාහරණ පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

i. මහා මාර්ගය, බස්, ඛනිජ තෙල්, බස් නැවතුම

ii. මහා මාර්ගය, ඛනිජ තෙල්, බස්, බස් නැවතුම

iii. මහා මාර්ගය, බස් නැවතුම , ඛනිජ තෙල් , බස්

iv. මහා මාර්ගය, බස් නැවතුම , බස්, ඛනිජ තෙල්

24-07-2019
Grade - 11

13. පහත දැක්වෙන්නේ වෙළෙඳාමක් සිදුවූ අවස්ථා කිහිපයකි.

A - ආපන ශාලා හිමියෙකු වූ සම්පත් සිය ආපන ශාලාවේ අලෙවි කිරීම සඳහා බේකරි නිෂ්පාදන මිලදී ගැනීම.

B - දන්සලක් දීම සඳහා ප්‍රියන්ත සහල් කිලෝ ග්‍රෑම් 100 ක් මිලදී ගැනීම.

C - ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවෙකු වන සුනිල් විසින් සිමෙන්ති කොට්ට 1 000 ක් මිලදී ගැනීම.

ඉහත වෙළෙඳාම් අතරෙන් සිල්ලර වෙළෙඳාමට අයත් වනුයේ,

i. A පමණි  ii. B පමණි  iii. A හා C ය.  iv. A හා B ය.

14. නිෂ්පාදන කළමණාකරුවෙකු විසින් තම සේවකයන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් සැපයීමට අයත් වනුයේ කළමනාකරණ ක්‍රියාවලියේ කුමන කාර්යයට ද?

i. සැලසුම්කරණය  iii. මෙහෙයවීම
ii. සංවිධානකරණය  iv. පාලනය.

15. සුවඳ විලවුන් වර්ගයක් ආකර්ෂණීය ඇසුරුමකින් වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. අලෙවිකරණ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙහිදී භාවිතා කර ඇත්තේ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යය ද?

i. නිෂ්පාදිතය  ii. මිල  iii. ස්ථානය  iv. ප්‍රවර්ධනය

16. බැංකු ගිණුමේ ඇති මුදල් වලින් සෘජුවම ගෙවීම් කිරීමට හැකිවන පරිදි වාණිජ බැංකු විසින් තම ගනුදෙනු කරුවන්ට නිකුත් කරන කාඩ්පත් වනුයේ,

i. ණය පත්  ii. හර පත්  iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පත්  iv. විද්‍යුත් කාඩ්පත්

17. ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| වත්කම් | = | අයිතිකරුගේ හිමිකම + | | වගකීම් |
|---|---|---|---|---|
| + 50 000 | = | | + | + 50 000 |

ඉහත ගිණුම්කරණ සමීකරණයේ සටහන් කර ඇති ගනුදෙනුව වන්නේ,

i. නාමල්ගෙන් රු. 50 000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
ii. රු. 50 000 ක කොමිස් ආදායම් ලැබීම.
iii. රු. 50 000 ක බැංකු ණය පියවීම.
iv. අයිතිකරු විසින් රු. 50 000 ක ප්‍රාග්ධන යෙදීම.

Learning Resource Center
R
De Mazenod College
Kandana

18. පහත ගනුදෙනු අතරින් හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුව වන්නේ,

i. ණයගැතියෙකු වූ රසිකගෙන් රු. 20 000 ක් ලැබීම.
ii. අයිතිකරු විසින් රු. 50 000 ක් ව්‍යාපාරයට යෙදවීම.
iii. බැංකු ණයෙන් කොටසක් ලෙස රු. 25 000 ක් ගෙවීම.
iv. අයිතිකරු රු. 5 000ක භාණ්ඩ සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

19. ගනුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහනක් පහත දැක්වේ.

ණය හිමි ගිණුම හර රු. 10 000

මුදල් ගිණුම බැර රු. 10 000

සිදුවී ඇති ගනුදෙනුව වන්නේ,

i. රු. 10 000 ක් වටිනා බඩු තොගයක් ණයට ගැනීම
ii. රු. 10 000 ක භාණ්ඩ ණයට ගැනීම
iii. රු. 10 000 ක භාණ්ඩ අත්පිට ගැනීම
iv. ණය හිමියෙකුට රු. 10 000 ක් ගෙවීම

20. පහත X තීරුවේ ගිණුම් වර්ගය ද , Y තීරුවේ ලෙජර් ගිණුම් කිහිපයක් ද වේ.

| X | Y |
|---|---|
| i. වත්කම් ගිණුම | A - රක්ෂණ ගාස්තු ගිණුම |
| ii. වගකීම් ගිණුම | B - විකුණුම් ගිණුම |
| iii. ආදායම් ගිණුම | C - මුදල් ගිණුම |
| iv. වියදම් ගිණුම | D - උපචිත ප්‍රචාරන වියදම් |
| | |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග, Y තීරුවේ සඳහන් ලෙජර් ගිණුම් සමඟ අනුපිළිවෙලින් ගැළපූ විට ලබෙන පිළිතුර වන්නේ,

i. B,C,D හා A ය  ii. C,B,A හා D ය  iii. C,D,B හා A ය  iv. D,C,B හා Aය

21. "වැඩිවීම හර, අඩුවීම බැර" යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපණය වන ගිණුම වන්නේ,

i. ප්‍රාග්ධන ගිණුම  ii. බැංකු ණය ගිණුම
iii. විකුණුම් ගිණුම  iv. ණය ගැති ගිණුම

22. ව්‍යාපාරයක් රු. 10 000 ක කොමිස් ආදායම් ලැබීම, සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ලදුපත , මුදල් පොත
ii. ලදුපත , සුළු මුදල් පොත
iii. ජ'නල් වවුචරය, මුදල් පොත
iv. මුදල් පොත, ලදු පොත

23. බැංකු ප්‍රකාශනයේ හර තීරුවේ සටහන් කරනු ලබන්නේ,

i. ණයගැති ප්‍රේෂණ
ii. මුදල් තැන්පතු
iii. චෙක්පත් තැන්පතු
iv. බැංකු ගාස්තු

24. 2018.04.30 දින ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 23 100 ක් වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු. 24 600 ක් විය. මෙම වෙනසට හේතු වූ ගනුදෙනුව වන්නේ,

i. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 1 500

24-07-2019
Grade - 11

ii. බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ 15 00
iii. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ බැංකු ණය වාරික 1 500
iv. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ රක්ෂණ ගාස්තු 1 500

25. නැණසර පොත්හල විසින් එකක් රු. 50 බැගින් අභ්‍යාස පොත් 20 ක් ණයට විකුණූ අතර එහිදී අඩුකළ වෙළඳ වට්ටම 5% ක් විය. මෙම ගණුදෙනුව නිසා ව්‍යාපාරයේ,
i. දුන් වට්ටම් රු. 50 කින් වැඩිවේ.
ii. විකුණුම් ආදායම රු. 1 000 කින් වැඩි වේ.
iii. ණයගැති වටිනාකම රු. 950 කින් වැඩිවේ.
iv. ණයගැති වටිනාකම රු. 1 000 කින් වැඩිවේ.

26. නාමලිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 3 000 කි. 2016.03.31 සුළු මුදල් භාරකරු සතුව තිබූ මුදල රු. 400 ක් වූ අතර 2016.04.01 දින සිට ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 4 000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී. 2016.04.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන කුමක්ද ?

i. මුදල් පොත හර රු. 2 600
සුළු මුදල් පොත බැර රු. 2 600

ii. සුළු මුදල් පොත හර රු. 2 600
මුදල් පොත බැර රු. 2 600

iii. මුදල් පොත හර රු. 3 600
සුළු මුදල් පොත බැර රු. 3 600

iv. සුළු මුදල් පොත හර රු. 3 600
මුදල් පොත බැර රු. 3 600

27. පොත හලක සිදුවී තිබූ ගනුදෙනු දෙකක් පහත දැක්වේ.
A - පොත් රාක්ක ව්‍යාපාරයකින් රු. 40 000 ක පොත් රාක්ක ණයට ගැනීම.
B - රු. 20 000 ක පොත් ණයට විකිණීම
ඉහත A හා B ගනුදෙනු සටහන් කළයුතු මූලික පොත් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
i. පොදු ජ'නලය , විකුණුම් ජ'නලය
ii. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය
iii. ගැනුම් ජ'නලය, පොදු ජ'නලය
iv. පොදු ජ'නලය, ගැනුම් ජ'නලය

28. ව්‍යාපාරයක් ණය හිමියෙකුට රු. 5 000 ක් ගෙවීම, සටහන් කළයුතු මූලාශ්‍ර ලේඛනය වන්නේ,
i. ලදු පත
ii. වවුචරය
iii. ගැනුම් ඉන්වොයිසිය
iv. විකුණුම් ඉන්වොයිසිය

29. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේදී සිදුවූ වැරද්දක් නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහනකි.

ගොඩනැගිලි අලුත්වැඩියා ගිණුම හර 50 000

ගොඩනැගිලි ගිණුම බැර 50 000

ඉහත ජ'නල් සටහනට අනුව සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය වනුයේ,

i. රු. 50 000 ක ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ගිණුම්වල සටහන් නොවීම
ii. රු. 50 000 ක ගොඩනැගිල්ලක් මිලදී ගැනීම ගොඩනැගිලි අලුත්වැඩියා ගිණුමේ සටහන් කර තිබීම.
iii. ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 50 000 ගොඩනැගිලි ගිණුමට බැර කර තිබීම.
iv. ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 50 000 ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම.

30. සුළු මුදල් පොතේ ගමන් ගාස්තු තීරුවේ එකතු වූ රු. 300 ක් ගමන් ගාස්තු ගිණුමේ සටහන් කර නැත. මෙම වැරද්ද නිවරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන වනුයේ,

i. ගමන් ගාස්තු ගිණුම හර රු. 300
සුළු මුදල් පොත බැර රු. 300

ii. සුළු මුදල් පොත හර රු. 300
ගමන් ගාස්තු බැර රු. 300

iii. ගමන් ගාස්තු ගිණුම හර රු. 300
අවිනිශ්චිත ගිණුම බැර රු. 300

iv. අවිනිශ්චිත ගිණුම හර රු. 300
ගමන් ගාස්තු ගිණුම බැර රු. 300

31. 2017.01.01 දින රු. 200 000 ක පිරිවැයට මිලදී ගත් ලී බඩුවල ඵලදායි ජීව කාලය අවුරුදු 10 ක් වූ අතර එහි සුන්බුන් අගය රු. 20 000 කි. 2018. 12.31 දිනට ක්ෂය වෙන් කිරීම් ගිණුමේ ශේෂය වනුයේ,

i. 180 000 ii. 20 000 iii. 36 000 iv. 40 000

පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 32,33 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සාගර ව්‍යාපාරය 2018.01.01 දින 10% ස්ථාවර තැම්පතුවල රු. 500000ක් ආයෝජනය කරන ලදී. 2018 වර්ෂයේදී මුදලින් ලද ස්ථාවර තැම්පතු පොළිය රු. 30000කි.

32. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරනු ලබන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කළයුතු පොලි ආදායම වනුයේ,

i. 50 000 ii.30 000 iii. 20 000 iv. 5 000

33. 2018.12.31 දිනට පිළියෙළ කරනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළයුතු වටිනාකම වනුයේ,

i. 50 000 ii. 30 000 iii. 20 000 iv. 5 000

34. සුනිමල් ව්‍යාපාරය විසින් 2018.05.01 දින ලබාගත් 12% බැංකු ණය රු. 100 000 ක් වූ අතර, 2018 වර්ෂයේ අවසාන මාස 02 ක බැංකු ණය ගෙවා නැත. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරනු ලබන ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් කළයුතු බැංකු ණය පොලි වටිනාකම වනුයේ,

1. 8 000 ii.12 000 iii. 2 000 iv. 4 000

35. පහත තොරතුරු භාවිතා කර ප්‍රශ්න අංක 35 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2018 01.01 දින ආරම්භ කරන ලද සමන්ගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් | | 200 000 |
| ගැණුම් | 120 000 | |
| ගෙන ඒමේ කුලී | 10 000 | |
| රක්ෂණ ගාස්තු | 5 000 | |
| ඉඩම් | 500 000 | |
| ගොඩනැගිලි කුලී | 20 000 | |
| ප්‍රචාරණ වියදම් | 16 000 | |
| විදුලි වියදම් | 14 000 | |
| 10% බැංකු ණය | | 50 000 |
| බැංකු ණය පොලි | 2 000 | |
| ණයගැති | 18 000 | |
| ණය හිමි | | 15 000 |
| අත ඉතිරි මුදල් | 40 000 | |
| බැංකු අයිරා | | 20 000 |
| ප්‍රාග්ධනය | | 460 000 |
| | 745 000 | 745 000 |

අතිරේක තොරතුරු

1. 2018.12.31 දිනට අවසාන තොගය රු. 20 000 කි.
2. 2018.12.31 දිනට උපචිත ප්‍රචාරණ ගාස්තු රු. 4 000 කි.
3. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වනුයේ,

i. 150 000 ii. 140 000 iii. 100 000 iv. 110 000

36. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,

i. 50 000 ii. 60 000 iii. 90 000 iv. 100 000

37. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෙදා හැරීමේ වියදම් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුලත් වනුයේ,

i. ප්‍රචාරණ වියදම් ii. විදුලි ගාස්තු iii. ගොඩනැගිලි කුලී iv. බැංකු පොලි

38. ඉහත ව්‍යාපාරයේ 2018.12.31 දිනට අයිතිකරුගේ හිමිකම වනුයේ,

i. 460 000 ii. 486 000 iii. 578 000 iv. 478500

39. ඉහත ව්‍යාපාරයේ 2018.12.31 දිනට ජංගම වත්කම්වල අගය වනුයේ,

i. 42000 ii. 38000 iii. 78000 iv. 50000

40. ඉහත ව්‍යාපාරයේ 2018.12.31 දිනට මුළු වත්කම් වල වටිනාකම වනුයේ,

i. 500 000 ii. 78 000 iio. 578 000 iv. 486 000

ද මැසිනොද් විදුහල - කඳාන

දෙවන වාර පරීක්ෂණය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

11 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　　　　　　　කාලය- පැය 2 යි.

පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01) විශ්‍රාමික ගෘහ විද්‍යා ගුරුවරියක් වන කුමාරි 2019.01.01 දින සිය නිවසට යාබද ව පේස්ට්‍රි අලෙවි සැලක් ආරම්භ කරන ලදී. ඇය විසින් මුදල් රු. 300 000 ක් හා රු. 100 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරය තුළ ආයෝජනය කරන ලදී. කුමාරිගේ නිවස මහා මාර්ගය අසල ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටා ඇත. ඇයට සැලකිය යුතු දෛනික අලෙවිය හා ප්‍රමාණවත් ආදායමක් ලබා ගැනීමට හැකිවිය. පළමු මාසය අවසානයේ රු. 100 000 ක බැංකු ණයක් ලබා ගනිමින් ව්‍යාපාරය පුළුල් කිරීමට කුමාරි තීරණය කර ඇත.

2019/01/31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු අදාල වේ.

| | රු. |
|---|---|
| පාන්පිටි හා අනෙකුත් අමුද්‍රව්‍ය මිලට ගැනීම | 100 000.00 |
| අත්පිට විකුණුම් | 200 000.00 |
| ණයට විකුණුම් | 50 000.00 |
| සේවකයන්ට ගෙවන ලද වැටුප් | 50 000.00 |
| විදුලි ගාස්තු ගෙවීම | 10 000.00 |
| පාන්පිටි හා අනෙකුත් අමුද්‍රව්‍ය ණයට ගැනීම | 50 000.00 |
| ණය හිමියන්ට ගෙවීම | 30 000.00 |
| 2019.01.31 බැංකු ණය | 100 000.00 |

Learning Resource Centre
De Mazenod College
Kandana
R

ව්‍යාපාර ගනුදෙනු කිරීමේ පහසුව සඳහා 2019.01.02 දින රු. 80 000 ක් තැන්පත් කරමින් බැංකු ජංගම ගිණුමක් කුමාරි විසින් ආරම්භ කරන ලදී.

(i) (අ) කුමාරිගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් දැයි දක්වන්න.
(ආ) රු. 300 000 ක් ව්‍යාපාරයේ ආයෝජනය කිරීම කුමන නිෂ්පාදන සාධකයට අයත් වේද?

(ii) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි අවස්ථාවක් ලියන්න.

(iii) (අ) 2019.01.01 දින ව්‍යාපාරයේ ප්‍රාග්ධන වටිනාකම දක්වන්න.
(ආ) 2019 ජනවාරි මාසය සඳහා මුදල් ගිණුම පිළියෙල කරන්න.

(iv) (අ) බැංකු ණය ලබාගැනීමට අදාළ ද්විත්ව සටහන දක්වන්න.
(ආ) බැංකු ණය ගිණුම අදාළ වන ගිණුම් වර්ගය දක්වන්න.

(v) (අ) "කුමාරි සිල්ලර වෙළඳාමේ නිරත වේ"
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වේ ද? හේතු දක්වන්න.

(vi) (අ) ඉහත සිද්ධියේ දැක්වෙන උපකාරක සේවාවක් සඳහන් කරන්න.
(ආ) එම උපකාරක සේවයේ වාසි 2 ක් සඳහන් කරන්න.

(vii) (අ) බැංකු ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(viii) (අ) වත්කම් සඳහා උදාහරණ දෙකක් ඉහත සිද්ධිය ඇසුරෙන් දක්වන්න.
(ආ) හිමිකම් සඳහා උදාහරණයක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(ix) (අ) මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් පාර්ශව 2 ක් දක්වන්න.

(ආ) ඉහත පාර්ශව වල අරමුණු බැගින් සඳහන් කරන්න.

(x) 2019.01.31 න් අවසන් මාසය සඳහා කුමාරිගේ ව්‍යාපාරයෙන් ලාභය ගණනය කරන්න.

(10 x 2= ලකුණු 20)

I. කොටස - ව්‍යාපාර අධ්‍යයනය

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න

(02) (i) (අ) වුවමනා යනු කුමක්ද?

(ආ) වුවමනා වල ලක්ෂණ 2 ක් දක්වන්න (ලකුණු 02)

(ii) පහත ප්‍රකාශ වල සත්‍ය අසත්‍ය බව දක්වන්න.

(අ) ව්‍යාපාරය තුළින් විවිධ අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන සේවකයින්, බාහිර පරිසරයට අයත් වේ.

(ආ) ව්‍යාපාරයක භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා ස්භාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

(ඇ) සමුපකාර, පෞද්ගලික අංශයේ ලාභ අරමුණු නොමැති ව්‍යාපාර සංවිධාන ගණයේ අයත් වේ.

(ඈ) නිෂ්පාදිත වල ස්වරූපය අනුව ව්‍යාපාර, භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සැපයීමේ ව්‍යාපාර ලෙස වර්ග කර හැක. (ලකුණු 02)

(iii) අමල් හා කමල් එක්ව රෙදිපිළි අලෙවි කිරීමේ ව්‍යාපාරයක් "අම්කා ටෙක්ස්ටයිල්ස්" යන නමින් පවත්වාගෙන යයි.

(අ) "අම්කා ටෙක්ස්ටයිල්ස්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

(ආ) "අම්කා ටෙක්ස්ටයිල්ස්" ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි 2 ක් දක්වන්න.

(iv) "රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාම නිසා බොරතෙල් ආනයනය කිරීමේ පිරිවැය ඉහළ ගොස් ඇත."

(අ) ඉහත ප්‍රකාශයට අනුව බලපෑම් එල්ල වන ව්‍යාපාර පරිසර සාධකය කුමක්ද?

(ආ) බොරතෙල් භාවිතය අවම කිරීම සඳහා ආදේශකයක් යෝජනා කරන්න.

(ලකුණු. 02)

(මුළු ලකුණු 08)

(03) (i) (අ) තොග වෙළඳාම යනු කුමක්ද?

(ආ) වාණිජ බැංකු විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම්වල වාසි 2 ක් දක්වන්න. (ලකුණු 02)

(ii) පහත ප්‍රකාශන වල සත්‍ය අසත්‍යභාවය දක්වන්න.

(අ) සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර පවතින ප්‍රධාන වෙනස වන්නේ ගැනුම්කරුගේ චේතනාවයි.

25-07-2019
Grade 11
ව්‍යා. හා ගිණුම්කරණය

(ආ) විශේෂ රේඛනය සහිත චෙක්පතක් ඕනෑම වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක තැන්පත් කළ හැකිය.

(ඇ) දේපළ රක්ෂණයේ අවදානම නිශ්චිත වන අතර ජීවිත රක්ෂණයේ දී අවදානම අවිනිශ්චිත වේ.

සන්නිවේදන ක්‍රියාවලියෙදී පනිවුඩය ලබන්නා පණිවුඩය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිචාරය වේ.

(iii) "කුමාර ගාමන්ට්" නැව් මඟින් ඉන්දියාවේ සිට රෙදි ආනයනය කරයි"

(අ) ඉහතසිද්ධියේ සඳහන් ආනයනකරු හා අපනයනකරු නම් කරන්න.

(ආ) ඉහත සිද්ධියේ සඳහන් මාර්ගය හා මාධ්‍යය සඳහා නිදසුන බැගින් දක්වන්න. (ලකුණු.02)

(iv) අමල් විසින් මිලදී ගත් මෝටර්රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කර ඇත.

(අ) ඉහතින් සඳහන් රක්ෂිතයා හා රක්ෂකයා නම් කරන්න.

(ආ) රක්ෂණයේ හා ආරක්ෂණයේ වෙනස්කමක් දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

(04) (i) (අ) කළමනාකරණය යනු කුමක්ද?

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් 2 ක් දක්වන්න. (ලකුණු 02)

(ii) පහත ප්‍රකාශවල සත්‍ය අසත්‍ය භාවය දක්වන්න.

(අ) ව්‍යාපාරයේ කටයුතු සැලසුම් කළ ආකාරයෙන්ම සිදුවේ දැයි සොයා බැලීම සංවිධානකරණය වේ.

(ආ) ඉලක්ක වෙළඳපොළ යනු ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන්ම ලාභදායිව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළඳපොළ කොටසයි.

(ඇ) කළමනාකරුවන් විසින් සේවකයන් කළ යුතු කාර්යයන් පිළිබඳ ඔවුන් යොමු කිරීම මෙහෙය වීමයි.

(ඈ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුතු නිෂ්පාදිතයන් නිපදවීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි.

(iii) ව්‍යාපාරයන් විසින් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිෂ්පාදනයට තීරණය කර ඇත. එමෙන්ම ඒ සඳහා ඉහළ තාක්ෂණයෙන් යුතු යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම පියවරක දීම තත්ත්ව පාලක විසින් ගුණාත්වය පරීක්ෂාකරනු ලබයි. ඒ සඳහා නිෂ්පාදන කළමනාකරු විසින් අවශ්‍ය උපදෙස් තත්ත්ව පාලකට ලබාදෙයි.

පහත දක්වා ඇති ආකෘතියට අනුව කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන් හතර දක්වා සෑම කාර්යයකටම නිදසුන බැගින් සිද්ධීන් ඇසුරෙන් දක්වන්න.

| කළමනාකරණ කාර්යය | නිදසුන |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |



Learning Resource Centre
R
De Mazenod College
Kandana

(iv) ව්‍යාපාරයක් විසින් කිරිපිටි නිෂ්පාදනය කර වෙළෙඳපොළට සපයනු ලබයි. කළමනාකරණය විසින් නව ළදරු කිරිපිටි වර්ගයක් නිෂ්පාදනය කිරීමට තීරණය කර ඇත.

(අ) මෙම තීරණයට අදාලව ඉලක්ක වෙළෙඳපොළ දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයට තම අලෙවිය වර්ධනය කර ගත් හැක්කේ කෙසේද ?

## II කොටස

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(05) (i) (අ) වත්කමක් යනු කුමක් ද?

(ආ) ලේජරයේ දැකිය හැකි ගිනුම්වර්ග දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියා දක්වන්න.

(අ) අයිතිකරු විසින් සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක් ගැනීම.

(ආ) රු. 100 000 ක් වටිනා භාණ්ඩ ණයට ගැනීම. (ලකුණු 02)

(iii) 2018.01.01 දිනට ව්‍යාපාරයක වත්කම්, වගකීම් හා හිමිකම් ශේෂයන් හා ජනවාරි මාසයේ පලමු සතියේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

| | වත්කම්(රු) | = | හිමිකම(රු) | + වගකීම්(රු) |
|---|---|---|---|---|
| 2018.01.01 ශේෂය | 400 000 | = | 300 000 | + 100 000 |
| 1. | + 50 000 (තොගය) | = | | + 50 000 (වෙ.ණයහිමි) |
| 2. | - 20 000(තොගය)<br>+30 000 (මුදල්) | = | +10 000 (ලාභය) | |
| 3. | -7 000 (මුදල්) | = | - 7 000 (විදුලිය) | |
| 4. | - 30 000 (මුදල්) | = | | - 30 000 (වෙ.ණයහිමි) |

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුව වට්නාකම් සහිතව දක්වන්න.

(ආ) 2018 ජනවාරි මාසයේ පළමු සතියේ අවසාන දිනට හිමිකමෙහි සිදුවී ඇති අඩුවීම හෝ වැඩිවීම කොපමණ ද?

(iv) ව්‍යාපාරයක 2018 මාර්තු මාසය තුල සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

5/15 ඉන්වොයිස් අංක 008 යටතේ නිමල්ගෙන් රු. 8 000 ක භාණ්ඩ ණයට ගැනීම.

5/25 ඉන්වොයිස් අංක 1005 යටතේ වීරගෙන් රු. 12 000 ක භාණ්ඩ ණයට ගැනීම.

5/27 ඉන්වොයිස් අංක 500 යටතේ රු. 40 000 ක් වටිනා භාණ්ඩ මයුරට ණයට විකිණීම.

5/29 ඉන්වොයිස් අංක 501 යටතේ රු. 18 000 ක් වටිනා භාණ්ඩ සමීරට ණයට විකිණීම.

අවශ්‍ය වන්නේ,

(අ) 2018 මාර්තුමාසය සඳහා ගැනුම් ජ'නලය හා විකුණුම් ජ'නලය පිළියෙළ කරන්න.

(ආ) ඉහත පිළියෙළ කරන ලද ගැනුම් ජ'නලයේ හා විකුණුම් ජ'නලයේ සඳහන් ගනුදෙනු ලේජරයේ සටහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු12)

(06) (i) (අ) බැංකු අයිරාවක් යනු කුමක් ද?

(ආ) ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) (අ) ශේෂ පිරික්සුමේ සමානතාවයට බල නොපාන ගිණුම්කරණ වැරද්දක් සඳහා උදාහරණයක් දක්වන්න.

(ආ) ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපාන ගිණුම්කරණ වැරද්දක් සඳහා උදාහරණයක් දක්වන්න. (ලකුණු 02)

(iii) ව්‍යාපාරයක සිදුවී ඇති ගිණුම්කරණ වැරදි කිහිපයක් පහත දැක්වේ.

(අ) රු. 5 000 ක ණයට විකුණුම්, විකුණුම් ජ'නලයේ සටහන් වී ඇත්තේ රු. 500 ක් ලෙසය.

(ආ) දුන් වට්ටම 1 300 ක් අදාල ණයගැති ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 3 100 ක් ලෙසය.

අවශා වන්නේ,

ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා අවශා ජ'නල් සටහන් (ලකුණු 04)

(iv) කුමාරගේ ව්‍යාපාරයේ 2018.09.30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 20 000 ක් වූ අතර, 2018 සැප්තැම්බර් මාසය සඳහා ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ සමාන නොවිය. පසුව පරික්ෂා කිරීමේදී පහත සඳහන් හේතූන් සොයා ගන්නා ලදී.

(අ) බැංකු ගිණුමේ සටහන් නොවූ ස්ථාවර නියෝග මත කළ ගෙවීම් රු. 12 000 ක් විය.

(ආ) සැප්තැම්බර් මාසය තැන්පත් කළ නමුත් එම මාසය තුළ නිෂ්කාශනය නොවූ චෙක් පත් රු. 6 000 ක් විය.

(ඇ) සැප්තැම්බර් මාසය තුළ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 5000

අවශා වන්නේ,

(අ) 2018.09.30 දිනට සංශෝධිත බැංකු ගිණුම

(ආ) 2018 සැප්තැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

(ලකුණු 04)

(07) (i) (අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙළ කිරීමේ අරමුණ කුමක් ද?

(ආ) උපචිත වියදම් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන දක්වන්න.

(ii) ව්‍යාපාරයක2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | රු |
|---|---|
| විකුණුම් | [illegible]00.00 |
| ගැනුම් | 50000.00 |
| ගෙන ඒමේ කුලී | 20000.00 |
| පැටවුම් කුලී | 15000.00 |
| ආරම්භක තොගය | 30000.00 |
| අවසාන තොගය | 50000.00 |

විකුණුම් පිරිවැයෙහි අගය ගණනය කරන්න.

(iii) රංගගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර(රු.) | බැර(රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200 000.00 |
| බෙදාහැරීමේ රථ (පිරිවැයට) | 250 000.00 | |
| බෙදාහැරීම්මේ රථ ක්ෂය වෙන් කිරීම (01.01.2018 ) | | 30 000.00 |
| තොගය(2018.01.01 දිනට) | 35 000.00 | |
| 10% බැංකුණය | | 50 000.00 |
| රක්ෂණ ගාස්තු | 12 000.00 | |
| විකුණුම් | | 220 000.00 |
| ගැනුම් | 170 000.00 | |
| ණයගැති | 30 000.00 | |
| ණයහිමි | | 40 000.00 |
| ලද වට්ටම් | | 4 000.00 |
| දුන් වට්ටම් | 2 500.00 | |
| බැංකු ණය පොලී | 4 000.00 | |
| බෝල් ණය | 1 000.00 | |
| විදුලි ගාස්තු | 1 500.00 | |
| වරිපනම් | 2 000.00 | |
| පරිපාලන වියදම් | 6 000.00 | |
| මුදල් ශේෂය | 30 000.00 | |
| | 544 000.00 | 544 000.00 |

අමතර තොරතුරු

- 2018.12.31 දිනට තොගය රු. 30 000.00
- බෙදාහැරීමේ වැන් රථය සරල මාර්ග ක්‍රමයට 20% ක් ක්ෂය කළ යුතුයි.
- 2018.12.31 දිනට උපචිත රක්ෂණ ගාස්තු රු. 4 000.00

අවශ්‍ය වන්නේ

(අ) 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
(ආ) 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය